# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2416/39 - 2024 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2024.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස - ඉඩම්

### ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/5/2020/HW/151.
*මගේ යොමු අංකය* : DSWA/LND/4/ACQUI/F1/46.

වලස්මුල්ල නගර සංවර්ධනය යටතේ වලස්මුල්ල - වීරකැටිය මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම/පරවශතාවය පිළිබඳ විස්තර:*

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 454, වලස්මුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ කඩඉම් සිතියම් අංක 830470හි කැබලි අංක 01 සහ 02 ලෙස දැක්වෙන ඉඩම් කොටස්.

**01. කැබලි අංක 1**

ඉඩමේ නම : මිරිසියන් වත්ත; හිමිකම් කියන්නා : රජය; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර 0.0054

**02. කැබලි අංක 2**

ඉඩමේ නම : මිරිසියන් වත්ත; හිමිකම් කියන්නා : රජය; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර 0.0111

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනා තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025.05.19 දින පෙ.ව. 10.00 ට වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2025.05.05 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවය, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**කුමුදු සී. ලොකුහේවාගම,**
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

2024 දෙසැම්බර් මස 20 දින,
වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0268



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

අංක 2195/39 සහ 2020.10.02 දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* III කොටසෙහි 10-645 ට අදාළ 7 වන වගන්තිය යටතේ භාෂාත්‍රයෙන් පළ කරන ලද දැන්වීමෙහි ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම පිළිබඳ විස්තරයේ,

"සැලැස්මේ අංකය 61" වෙනුවට "අ.ග.පි. 71, අතිරේක අංක 4, පත්‍ර අංක 5 දරන සැලැස්මේ කැබලි අංක 61" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

**එච්. එම්. හේමන්ත බණ්ඩාර,**
ප්‍රාදේශීය ලේකම්,
ඇලපාත.

මගේ යොමු අංකය : ELDS/LND/04/ACQ/2014/04-III වෙළුම

2024 දෙසැම්බර් මස 13 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඇලපාත.

EOG 12 - 0269

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* : KDS/KGK/4/2(2)/2013/1/3.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/7/2013/HW/488.

උක්ත ශීර්ෂ යටතේ 2018 අප්‍රේල් මස 05 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2065/32 හා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි සඳහන් මෙහි පහත I ඡේදයේ සඳහන් කොටස ඉවත් කොට, ඒ වෙනුවට මෙහි II ඡේදයේ දැක්වෙන කොටස් ආදේශ කොට එම දැන්වීම සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**I ඡේදය**

**ඉවත් කළ යුතු කොටස**

**කැඩැස්තර සිතියම් අංක 320314 කලාප අංක 5න් 04 වැනි කලාපය, පත්‍ර අංකය 7හි**

**කැබලි අංකය 186**

ඉඩමේ නම: රඹුකේවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ සොහොන් දෙකක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: ශෂිකා ප්‍රියදර්ශනී කුමාරි ජයසුන්දර සහ අවිශ්ක ගයාන් බණ්ඩාර ජයසුන්දර, අංක 178/2, තලාතුඔය පාර, කැටවල, ලෙව්ල (කැබලි අංක 12හි කොටසක් අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0183

**II ඡේදය**

**ආදේශ කළ යුතු කොටස**

**කැඩැස්තර සිතියම් අංක 320314 හි කලාප 04 හි පත්‍ර අංක 10හි;**

**03. කැබලි අංක 01**
ඉඩමේ නම : රඹුකේවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: ජයසුන්දර මුදියන්සේලාගේ ශශිකා ප්‍රියදර්ශනී කුමාරි ජයසුන්දර; ප්‍රමාණය: හෙක්. 0.0044

**04. කැබලි අංක 02**
ඉඩමේ නම : රඹුකේවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: ධම්මික ප්‍රියංක බණ්ඩාර දහනක; ප්‍රමාණය: හෙක්ටයාර 0.0073

**05. කැබලි අංක 03**
ඉඩමේ නම : රඹුකේවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත, සිමෙන්තියෙන් බඳින ලද සොහොන් දෙකක කොටස් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: ජයසුන්දර මුදියන්සේලාගේ අවිශ්ක ගයාන් බණ්ඩාර ජයසුන්දර; ප්‍රමාණය: හෙක්ටයාර 0.0066

**මොහාන් ධර්මදාස,**
ප්‍රාදේශීය ලේකම් (*රාජකාරි ආවරණ*),
මහනුවර කඩවත්සතර හා ගඟවට කෝරළය.

2024 දෙසැම්බර් මස 19 වැනි දින,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0270

---

ශුද්ධි පත්‍රයයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2008/CEB/213.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* :
කල්/6/කරඹ/නිල නිවාස 02ග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1669/30 හා 2010.09.03 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද

7 වන වගන්තිය යටතේ දැන්වීමේ, "සර්වේ ජනරාල්ගේ අංක පු 4716 අතිරේක අංක හා 2010.05.31 දින දරන පිඹුරේ සඳහන් "යන්න " සර්වේ ජනරාල්ගේ අංක මුපිපු 4716 හා 2010.05.26 දින දරන පිඹුරේ සඳහන්" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**එස්. එම්. පී. නන්දසේන,**
ප්‍රාදේශීය ලේකම් (*රා.ආ.*),
කල්පිටිය.

2024 දෙසැම්බර් මස 09 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0271

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.